## V වන පරිච්ඡේදය

## මුදා හැරීම, කලින් දැරූ තනතුරකට නැවත පත් කිරීම සහ සේවය අවසන් කිරීම

1. කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක වෙනත් තනතුරකට පත්වීම සඳහා මුදා හැරීම

2. කොමිෂන් සභාවෙන් / උසස් අධ්‍යාපන ආයතනයෙන්/ විද්‍යාතනයෙන් බැහැර තනතුරකට සේවය සඳහා මුදා හැරීම

3. ස්ථිරවම මුදාහල තැනැත්තකු නැවත තමන් දැරූ තනතුරට පැමිණීම

4. සේවයෙන් ඉල්ලා අස්වීම

5. විශ්‍රාම ගැනීම

6. සේවය අවසන් කිරීම

7. සේවය අතහැර ගියා සේ සැළකීම

8. සේවයෙන් පහ කිරීම

9. මරණය නිසා සේවය අවසන් වීම

10. සේවය අවසානයේ ලැබෙන ප්‍රතිලාභ

## V වන පරිච්ඡේදය

### සේවයෙන් මුදා හැරීම, කලින් දැරූ තනතුරකට නැවත පත් කිරීම සහ සේවය අවසන් කිරීම

1. කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක වෙනත් තනතුරකට පත්වීම නිසා සේවයෙන් මුදා හැරීම

1.1 කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක වෙනත් තනතුරක් දරන තැනැත්තෙකු, කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක වෙනත් තනතුරක් සඳහා ඉල්ලුම් කරන විට, එකී ඉල්ලුම් පත සළකා බැලීය හැක්කේ ඔහු දරන තනතුරෙන් මුදා හැරිය හැකිනම් පමණි.

*මුදා හැරීමට එකඟත්වය පළ කිරීම, එම ඉල්ලුම් පත්‍රය සළකා බැලීමේ මූලික අවශ්‍යතාවයකි*

1.2 සාමාන්‍යයෙන් කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක වෙනත් තනතුරක පත්වීම භාර ගැනීමට පහත සඳහන් අවස්ථාවන්හි දී හැර ප්‍රතික්ෂේප නො කරනු ලැබේ.

*මුදා හැරීම ප්‍රතික්ෂේප කිරීම*

1.2.1 දරන තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය විසින් යම් තැනැත්තකු හට විශේෂ පුහුණුවක් ලබා දී ඇත්නම් හෝ දරන තනතුරට අදාල බඳවා ගැනීමේ පරිපාටියෙහි නියම කොට ඇති විශේෂ සුදුසුකම් පිළිබඳව සළකා බැලීමෙන් පසු එම තනතුරට බඳවාගෙන ඇත්නම් හෝ එකී විශේෂ සුදුසුකම් වලින් අලුත් තනතුරට සෘජුවම වාසියක් නොලැබෙන්නේ නම් සහ /හෝ

1.2.2 ඔහු අලුත් තනතුරට පත් කිරීම නිසා කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනයට / විද්‍යායතනයට ලැබිය හැකි වාසි අභිබවා, ඔහුගේ මුදා හැරීම හේතුවෙන් කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයේ / විද්‍යාතනයේ වැඩ සඳහා අහිතකර ලෙස බලපාන්නේ යැයි නිගමනය කළ විට

1.3 ඉහත 1.2 උපඡේදයෙහි සඳහන් කරුණු පාදක කොට ගෙන, කොමිෂන් සභාවේ සභාපතිවරයාට / උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාට, යම් තැනැත්තෙකු මුදාහැරිය නොහැකි අවස්ථාවක දී, එම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන අවස්ථාවේ දී, ඉල්ලුම් පත්‍රයේ ඒ බව සටහන් කළ යුතු අතර, ඒ සඳහා පාදක වූ හේතු ද දැක්විය යුතු ය.

*ප්‍රතික්ෂේප කිරීමට හේතු දැක්විය යුතු ය*

1.4 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක තනතුරක් දරන තැනැත්තෙකු කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක වෙනත් තනතුරක් සඳහා නිසි ලෙස බලය ලත් පත් කිරීමේ බලධරයකු විසින් පත් කරනු ලැබූ විට, එම තැනැත්තාගේ ඇපබැඳුම්කර තිබේ නම්, එම ඇපබැඳුම්කර නිසි පරිදි පැවරීමට හා තමන් යටතේ තිබූ සියළු බඩු භාහිරාදිය තමාගෙන් පසුව එම තනතුරට පත් කළ තැනැත්තාට හෝ අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාවේ ලේකම්වරයා /

*තනතුරක සේවය භාර ගැනීම සඳහා ස්ථිරවම මුදා හැරීම*

උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධරයා විසින් නම් කරනු ලැබූ තැනැත්තෙකුට නිසි පරිදි භාරදීමෙන් අනතුරුව නව තනතුරේ රාජකාරී භාර ගැනිම සඳහා ස්ථිරවම මුදා හරිනු ඇත. එසේ ස්ථිරවම මුදා හරිනු ලැබූ තැනැත්තෙකු හට කලින් තමන් දැරූ නිත්‍ය තනතුරට නැවත පැමිණීමට අවසරයක් නොමැති සේ මුදාහරින ලද බව සැළකිය යුතුය.

1.5 ආචාර්යවරයෙකු උසස් අධ්‍යාපන ආයතනයක තනතුරක් භාර ගැනීම සඳහා ස්ථිරවම මුදා හැරීම, අදාල ආයතන දෙකෙහිම පාලක බල මණ්ඩල වල අන්‍යෝන්‍ය එකඟතාවය මත සිදුවිය යුතු ය. එකී ආකාරයටම අදාල ආචාර්යවරයා තමන් කලින් සේවය කළ ආයතනයට ඇති ඇපබැඳුම්කර සහ අනෙකුත් බැඳීම් සම්බන්ධයෙන් ද ක්‍රියා කළ යුතු වේ. ඒ අනුව, එම ආචාර්යවරයාගේ නව සේවා යෝජකයා විසින් අදාළ ඇපබැඳුම්කර සහ අනෙකුත් බැඳීම් සම්බන්ධයෙන් ඇපවිය යුතු අතර, එවැනි ආචාර්යවරයකු විසින් කලින් සේවය කළ ආයතනයට කිසියම් ගෙවීමක් කළ යුතු යැයි අපේක්ෂා නොකෙරේ. — අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් ස්ථිරවම මුදා හැරීම

2. **කොමිෂන් සභාවෙන්/ උසස් අධ්‍යාපන ආයතනයකින් / විද්‍යායතනයකින් පිටත සේවය සඳහා මුදා හැරීම**

2.1 කොමිෂන් සභාවේ සේවයේ නියුතු තැනැත්තකු, කොමිෂන් සභාවෙන් පිට, රාජ්‍ය දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත ආයතනයකට හෝ සේවය සඳහා ස්ථිරවම හෝ තාවකාලික වශයෙන්, කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව මුදා හැරිය හැකි ය. — මුදා හැරීම කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව

2.2 උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුක්ත, ආචාර්යවරයකු නොවන තැනැත්තකු, ආයතනයෙන් පිට, රාජ්‍ය දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක සේවය සඳහා අදාල පාලක බල මණ්ඩලයේ අනුමැතිය ඇතිව ස්ථිරවම හෝ තාවකාලිකව මුදාහැරිය හැකි ය. — මුදා හැරීම පාලක බල මණ්ඩලයේ අනුමැතියට යටත්ව

2.2.1 ඉහත 2.2 ඡේදයේ සඳහන් කොන්දේසි වලට යටත්ව, කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු ආචාර්යවරයකු / නිලධාරියෙකු අවුරුදු දෙකක (02) කට නොවැඩි කාලයක් සඳහා මුදා හැරිය හැකි ය. කෙසේ වුවද, ජාතික වශයෙන් වැදගත් මෙහෙවරක් සඳහා එම තැනැත්තාගේ සේවය තව දුරටත් දීර්ඝ කිරිමට අවශ්‍ය වු විට, එසේ දීර්ඝ කරන ලද කාල පරිච්ඡේදය සඳහා තවදුරටත් මුදා හැරීම කළ හැකි ය. — ආචාර්යවරුන් / නිලධාරීන් මුදා හැරිම අවුරුදු දෙකක (02) කාලයකට පමණි

2.3 මුදා හැරීම තවකාලික වශයෙන් වු විට, මුදාහැරීමේ නියමයන් පහත සඳහන් පරිදි වේ; — තාවකාලිකව මුදා හැරීම

2.3.1 මුදා හැරෙන කාලය අවුරුදු (02) ක කාලයකට නොවැඩි විය යුතු ය. එම කාලය අවසානයේ දී අදාල රාජ්‍ය දෙපාර්තමේන්තු / රාජ්‍ය සංස්ථාව හෝ ව්‍යවස්ථාපිත ආයතනය විසින් එම තැනැත්තාගේ සේවය තම ආයතනයට ස්ථිරව ම ලබා ගැනීමට අදහස් කරයි නම් සහ එසේ ස්ථිරව මුදා හැරීමට කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය වෙතින් විරෝධයක් නොමැති නම්, යන අවස්ථාවක දී හැර ඔහු නැවත වරක් තමා සේවය කළ කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයේ / විද්‍යාතනයේ සේවය සඳහා වාර්තා කළ යුතු ය.

2.3.2 යම් තැනැත්තකු තවකාලිකව මුදා හැර ඇත්තේ, රජයේ අවශ්‍යතාවය මත සහ ජාතික වශයෙන් වැදගත් කාර්යයන් ඉටුකිරීම පිණිස වන අවස්ථාවක දී, එසේ මුදාහැර ඇති කාල පරිච්ඡේදය VI වන පරිච්ඡේදයේ දහ අට (18) වන ඡේදයෙහි දක්වා ඇති පරිදි වැටුප් රහිත නිවාඩු ලබා ඇති කාලයක් සේ සළකනු ලැබේ. රජයේ අවශ්‍යතාවය මත

2.3.3 අදාල තැනැත්තා මුදාහැර ඇත්තේ ඔහු විසින් ම කරන ලද ඉල්ලීමකට අනුව නම්, එසේ මුදාහරින ලද කාලය වැටුප් රහිත නිවාඩු කාලයක් සේ සළකනු ලබන අතර, එකී මුදාහරින ලද කාලය තුල ඇතිවන්නා වූ පුරප්පාඩුවක උසස්වීම් සඳහා ඔහුව සළකා බලනු නොලැබේ. අදාල තැනැත්තාගේ අවශ්‍යතාවය මත

2.3.4 යම් තැනැත්තකු වැටුප් රහිත නිවාඩු මත මුදා හරින අවස්ථාවක දී, ඔහු විසින් කොමිෂන් සභාවෙන් / උසස් අධ්‍යාපන ආයතනයෙන් / විද්‍යාතනයෙන් ලබා ගත් ණය මුදල් සහ අත්තිකාරම් පියවන ලෙසට හෝ එසේ පියවීමට සැලසුම් කර ඇති ආකාරය හෝ දන්වන ලෙසට දැනුම් දිය යුතු ය. එසේ ඉදිරිපත් කරන ලද සැලසුමකට, අදාල බැංකුවෙන් / මුල්‍ය ආයතනයෙන් ණය වාර්තා මාසිකව ගෙවීමට එකඟ වූ බව දැක්වෙන ස්ථාවර නියෝගයන්ද ඇතුලත් විය යුතු ය. ලබාගත් ණය සහ අත්තිකාරම් පියවන ආකාරය

ඉහත දක්වා ඇති කරුණු වලට වැඩිමනක් වශයෙන්, තමන් සන්තකයේ ඇති සියළුම ලිපි ලේඛන, යතුරු, බඩු බාහිරාදිය ආදී දේ මුදා හැරීම ලබා ගැනීමට ප්‍රථමයෙන් කොමිෂන් සභාවට / උසස් අධ්‍යාපන ආයතනයට/ විද්‍යායතනයට භාරදීමට කටයුතු කළ යුතුවේ.

2.4 තාවකාලික මුදා හැර සිටි තැනැත්තකු කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයේ / විද්‍යායතනයේ ඔහු දැරූ තනතුර සඳහා නැවත පැමිණීමේ දී ඔහුගේ ජ්‍යෙෂ්ඨත්වය III වන පරිච්ඡේදයේ 27.3.3 සහ 27.3.4 යන උපඡේදයන් හි සඳහන් නියමයන්ට අනුව සහ ඔහුගේ නැවත සේවයට පැමිණීමේ නියමයන්

වැටුප VI වන පරිච්ඡේදයේ හත්වන (07) වන ඡේදයහි සඳහන් නියමයන්ට අනුව තීරණය කළ යුතු ය.

### 3. ස්ථිරවම මුදාහල තැනැත්තකු නැවත තමන් දැරූ තනතුරට පැමිණීම

3.1 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක එකී ආයතනයක වෙනත් තනතුරක් භාර ගැනීම සඳහා හෝ පිටත ආයතනයක තනතුරක් භාර ගැනීම සඳහා සේවයෙන් ස්ථිරවම මුදාහරින ලද තැනැත්තකු හට, තමන් කලින් දැරූ තනතුරට නැවත පැමිණීමට හිමිකමක් නොමැත.

*තනතුරට නැවත පැමිණීමට අයිතියක් නොමැත*

3.2 යම් හෙයකින්, අදාල තැනැත්තා විසින් නියමිත නිලධාරීන් මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලැබූ අභියාචනයක් මත, නැවත තමා කලින් දැරූ තනතුරට පැමිණීමට අවසර දෙන්නේ නම්, එම අවසරය කොමිෂන් සභාවේ අනුමැතිය මත ලබාදිය යුතු අතර, එය සැම කරුණක් සඳහාම අදාල බඳවා ගැනීමේ පරිපාටියෙන් බැහැරව සිදු කරන ලද නව පත්වීමක් ලෙස සැළකිය යුතු වේ.

*කවර අවස්ථාවක කවුරුන් විසින් අවසරදෙනු ලැබුවේද*

3.3 එසේ නැවත සේවයට පැමිණීම සඳහා අවසරය ලබාදුන් අවස්ථාවක දී, එම තැනැත්තාගේ ජ්‍යෝෂ්ඨත්වය III පරිච්ඡේදයේ 27.3 උපඡේදයට අනුව සහ වැටුප් VI පරිච්ඡේදයේ 7 වන ඡේදය පරිදි තීරණය කළ යුතු වේ.

*නැවත පැමිණීමේ නියමයන්*

3.4 යම් තැනැත්තකු හට කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක තමන් කලින් දැරූ තනතුරට නැවත පැමිණීමට අවශ්‍ය වූ විට, අදාල පත්කිරීමේ බලධරයා වෙත නියමිත මාර්ගයෙන් එවන ලද අභියාචනයක් නව පත්වීමේ සේවය ආරම්භ කළ දිනයේ සිට මාස තුනක් (03) ඇතුලත ඉදිරිපත් කළ යුතුවේ. එවැනි අවස්ථාවල දී මෙහි 3.2 සහ 3.3 උපඡේදයන්හි සඳහන් නියමයන් ද බලපානු ලැබේ.

*තම ඉල්ලීම මත නැවත පැමිණීම*

### 4. සේවයෙන් ඉල්ලා අස්වීම

4.1 උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු ආචාර්යවරයෙකු විසින් තමා සේවය කරන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා හට තුන් මසක (03) ලිඛිත කල් දීමකින් පසු, තමා දරන තනතුරෙන් ඉල්ලා අස්විය හැකි ය. එවැනි දැනුම් දීමක් තම අධ්‍යයනාංශ ප්‍රධාන සහ පීඨයේ පීඨාධිපති මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වේ. විද්‍යායතනයන්හි සේවයේ නියුතු ආචාර්යවරුන් තම ඉල්ලා අස්වීම තමන්ගේ ප්‍රධාන විධායක නිලධරයා මාර්ගයෙන් තම අයතනය අනුබද්ධිතව සිටින විශ්වවිද්‍යාලයේ පාලක බල මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා එහි උපකුලපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

*ආචාර්යවරුන් සඳහා තුන් මසක (03) කල් දීමක් අවශ්‍යය*

4.1.1 ඉහත සඳහන් පරිදි තුන් මසක (03) දැනුම් දීමක් කළ නොහැකි අවස්ථාවක දී, ඒ වෙනුවෙන් එම ආචාර්යවරයා විසින් ආයතනට තුන් මසක මූලික වැටුපට සමාන මුදලක් ගෙවිය යුතු ය.එවැනි දැනුම් දීම තුන් මසක කාලයකට අඩුවන අවස්ථාවක දී පවා, අදාල ආචාර්යවරයා තුන් මසක කාලය ආවරණය වන පරිදි සම්පූර්ණ මුදලම ගෙවිය යුතු ය.

**කල්දීම අපහසු වන අවස්ථාවක දී**

4.1.2 ඉල්ලා අස්වීම සඳහා දැනුම්දීමක් කළ විට, එම තැනැත්තා හට කිසිඳු ආකාරයක නිවාඩු ගැනීම සඳහා හිමිකමක් නැත.

**නිවාඩු සඳහා හිමිකමක් නැත**

4.2 උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක තාවකාලික සහකාර කථිකාචාර්ය, තාවකාලික ප්‍රදර්ශක, තාවකාලික උපදේශක හෝ තාවකාලික පර්යේෂණ සහකාර වැනි තනතුරු දරන්නන් එක් මාසයක (01) කල් දීමකින් හෝ එක් මාසයක කාලය වෙනුවෙන් මාසයක වැටුප් ගෙවීමෙන් තම තනතුරෙන් ඉල්ලා අස්වීමට හැකි ය. කෙසේ වුවද, අදාල අධ්‍යයනාංශ ප්‍රධාන සහ පීඨයේ පීඨාධිපති මාර්ගයෙන් ඔවුන්ගේ නිර්දේශ ද සමඟ ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා හට එසේ, මාසයක කල් දීමක් සිදුකළ නොහැක්කේ මක් නිසා ද යන්න ගැන දක්වමින් අදාල තැනැත්තා විසින් ඉල්ලීමක් ඉදිරිපත් කළ අවස්ථාවක දී, එකී හේතු ගැන ප්‍රධාන විධායක නිලධරයා සෑහීමට පත්වන්නේ නම්, එම මාසයක කල්දීමේ අවශ්‍යතාවයෙන් ඔහුව නිදහස් කළ හැකි ය.

**තාවකාලික සහකාර කථිකාචාර්යවරුන් උපදේශකවරුන් ආදී අය**

4.3 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / ආචාර්ය නොවන තනතුරක් දරන තැනැත්තකු විසින් උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා / ලේඛකාධිකාරීවරයා හෝ කොමිෂන් සභාවේ නම් එහි ලේකම්වරයා හට එක් මාසයක ලිඛිත කල් දීමකින් පසු තම සේවයෙන් ඉල්ලා අස්විය හැකි ය. ආයතනයන්හි සේවයේ යෙදී සිටින ආචාර්යවරයකු නොවන තැනැත්තන් තම ඉල්ලා අස්වීමේ දැන්වීම එහි ප්‍රධාන විධායක නිලධරයා මාර්ගයෙන්, ආයතනය අනුබද්ධිතව ඇති විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාට / ලේඛකාධිකාරීවරයාට එක් මාසයක (01) කල් දීමකින් සිදුකළ හැකි ය.

**ආචාර්යවරුන් නොවන තැනැත්තන්ගේ ඉල්ලා අස්වීම්**

4.3.1 තමන් ඉල්ලා අස්වන බව දැනුම් දීම සඳහා එක් මාසයක (01) කල් දීම අපහසු වූ අවස්ථාවක හෝ එම කාලය තුල නිවාඩු ලබා තිබෙන විට හෝ එකී කල් දීමට හිලව් කිරීමක් වශයෙන් අදාල තැනැත්තා එක් මාසයක මූලික වැටුපට සමාන මුදලක් ගෙවිය යුතු වේ.

**කල් දීම අපහසු වූ අවස්ථාවක දී**

4.4 කොමිෂන් සභාවට / උසස් අධ්‍යාපන ආයතනයට / විද්‍යායතනයට යම් තැනැත්තෙකුගෙන් අයවිය යුතු සියළුම මුදල් පියවන තෙක් ඔහුගේ ඉල්ලා අස්වීම භාර නොගත යුතු ය.

**ගෙවීමට ඇති හිඟ මුදල් ගෙවිය යුතු ය**

4.5 ඉහත 4.1, 4.2, සහ 4.3 උපඡේද යටතේ දක්වා ඇති නියමයන්ට අනුව ලබා දුන් ඉල්ලා අස්වීමේ දැනුම් දීම 4.6 සහ 4.7 උපඡේදයන්හි දක්වා ඇති අවශ්‍යතා සපුරාලීමෙන් පසු අදාල පත් කිරීමේ බලධරයා විසින් පිළිගන්නා තෙක්, එම දැනුම් දීම ක්‍රියාත්මක නොවනු ඇත. — අනුමත කරන තෙක් ඉල්ලා අස්වීම ක්‍රියාත්මක නොවේ

4.6 ඉල්ලා අස්වීමේ ලිපියක් ලැබුනු විට, එම තැනැත්තා හට ඉල්ලා අස්වීමේ ප්‍රතිවිපාක දන්වමින් ලිඛිත දැනුම් දීමක් සිදු කළ යුතු වේ. එනම්; — ඉල්ලා අස්වීමේ ප්‍රතිවිපාක

(අ) ඉල්ලා අස්වීමෙන් පසු තමා නැවත කලින් දැරූ තනතුරට පැමිණීමට නොහැකි බව;

(ආ) පසුව කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයකට පැමිණ, නැවත සේවය ලබා ගැනීමට සමත් වුවහොත්, ඔහු කලින් කොමිෂන් සභාවට / උසස් අධ්‍යාපන ආයතනයට / විද්‍යායතනයට කරන ලද සේවය වෙනුවෙන් කිසිදු ප්‍රතිලාභයකට හිමිකමක් නොමැති බව;

(ඇ) ඔහුගේ ඉල්ලා අස්වීම භාරගත් පසු, එම ඉල්ලා අස්වීම නැවත ඉල්ලා අස් කර ගැනීමට කරනු ලබන ඉල්ලීම් සළකා නොබලන බව.

4.7 ඉහත දක්වා ඇති ඉල්ලා අස්වීමේ ප්‍රතිවිපාක ඔහුට දැනුම් දුන් බව සඳහන් ලිපියක්, එම තැනැත්තාගෙන් ලබා ගත යුතු අතර, එම ලිපිය අදාල තැනැත්තාගේ ඉල්ලා අස්වීමේ දැනුම් දීම සහිත ලිපිය ද සමඟ ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ගොනු කළ යුතු ය. — දැන්වීම ලැබුනු බව පිළිගැනීම

4.8 කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් හෝ උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක ලේඛකාධිකාරීවරයා විසින් අවස්ථාවෝචිත පරිදි, සේවයෙන් ඉල්ලා අස්වීමේ දැන්වීම, පත් කිරීමේ බලධරයා වෙත ඉදිරිපත් කිරීමේ දී, මෙහි 4.6 සහ 4.7 උපඡේදයන්හි සඳහන් අවශ්‍යතා ඉටුකර ඇති බව දැක්විය යුතු ය. — සපුරාලිය යුතු අවශ්‍යතා

4.9 තනතුරෙන් ඉල්ලා අස්වීම පත්කිරීමේ බලධරයා විසින් පිළිගත් බව, එම ඉල්ලා අස්වීම ඉදිරිපත් කළ තැනැත්තා හට ලිඛිත ව දැන්විය යුතු ය. — ලිඛිත ව පිළිගැනීම

4.10 තනතුරෙන් ඉල්ලා අස්වන තැනැත්තෙකුගේ, තමන් එසේ ඉල්ලා අස්වීමට පෙර කරන ලද සේවයට අදාල වූ යම් ප්‍රතිලාභ වලට ඇති හිමිකම, ඉල්ලා අස්වීම නිසා අහිමි වේ. — ප්‍රතිලාභ අහිමි වීම

4.11 පත්කිරීමේ බලධාරයෙකු විසින් යම් ආචාර්යවරයකුගේ / වෙනත් සේවකයකුගේ ඉල්ලා අස්වීම, එම පත් කිරීමේ බලධරයාට අනුව ඇති හේතු මත භාර නොගන්නා අවස්ථාවක දී, අදාල ආචාර්යවරයා / වෙනත් සේවකයා සේවයට වාර්තා කිරීමෙන් වැළකී සිටි නම්, එසේ සේවයට — ඉල්ලා අස්වීම භාරනොගත් විට

වාර්තා නොකරන දිනයේ සිට ඔහු, තම සේවය අතහැර ගිය අයෙකු සේ සැළකිය යුතු අතර, මෙම පරිච්ඡේදයේ 7 වන ඡේදයෙහි සඳහන් නියමයන් අනුව ක්‍රියාකළ යුතු ය.

4.12 අධ්‍යයන නිවාඩු මත සිටින ආචාර්යවරයකු / නිලධාරියෙකු එම කාලය තුල දී ඉල්ලා අස්වීම භාර දෙන්නේ නම්, එම තැනැත්තා අදාල උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය සමඟ අත්සන් කළ ඇපබැඳුම්කර සහ ගිවිසුම් කඩකල අයෙකු සේ සළකා ක්‍රියාකළ යුතු වේ.

අධ්‍යයන නිවාඩු මත සිටින ආචාර්යවරුන් / නිලධාරීන්

4.13 ආචාර්යවරයකු / නිලධාරියෙකු තම ඇපබැඳුම්කරයට අදාළ ගෙවීම්, නැවත ආයතනයට ගෙවීමට අවසර ඉල්ලා සිටි විටක දී ඒ සඳහා එම තැනැත්තාට අවසර දිය හැකි ය.

ඇපබැඳුම්කර නැවත ගෙවීම

4.13.1 එසේ ගෙවීම් කිරීම සඳහා ලබාදෙනු ලබන උපරිම කාලය මාස හතලිස් අටක් (48) වන අතර, කොමිෂන් සභාව විසින් හෝ පාලක බල මණ්ඩලය විසින්, එම උපරිම කාලය තවත් කාලයකින් දීර්ඝ කළ යුතු යැයි නිගමනය කරන අවස්ථාවක දී, එක් එක් අවස්ථාවට පාදක වූ කරුණු සළකා බලා එසේ තීරණය කළ හැකි ය.

නැවත ගෙවීමට ලබාදෙන උපරිම කාලය

4.14 සම්පූර්ණ අයවීම් නිසි පරිදි ගෙවා අවසන් කර ඇති විටක දී, එම තැනැත්තා ඉදිරිපත් කළ සේවයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය පිළිගැනීම සඳහා, කොමිෂන් සභාවට හෝ පාලක බල මණ්ඩලයට අවස්ථාවෝචිත පරිදි ඉදිරිපත් කළ යුතුය.

සම්පූර්ණ ගෙවීම් සිදු කළ විටකදී

5. **විශ්‍රාම ගැනීම**

5.1 තනතුරේ ස්ථිර කොට ඇති ආචාර්ය තනතුරක් දරන්නෙකු හට තමා වයස අවුරුදු 65 සම්පූර්ණ වන තුරු හෝ ඔහු සිය අවුරුදු 65 සම්පූර්ණ කරනුයේ යම් අධ්‍යයන වර්ෂයක් තුල දී නම්, එම අධ්‍යයන වර්ෂය අවසන් වනතුරු එනම්; අවුරුදු 65 ට එළඹීමෙන් අනතුරුව පැමිණෙන සැප්තැම්බර් මස 30 වන දින දක්වා සේවයේ යෙදිය හැකි අතර, එදිනට පසු ඔහු තනතුරෙන් විශ්‍රාම ගියා සේ සැළකේ. කෙසේ වුවද, යම් අධ්‍යයන වර්ෂයන් අදාල ආචාර්යවරයා අවුරුදු 65ට එළඹීමෙන් අනතුරුව පැමිණෙන සැප්තැම්බර් මස 30 වන දිනයෙන් ඔබ්බට දීර්ඝ වේ නම්, එම ආචාර්යවරයාට එකී දීර්ඝ කරන ලද අධ්‍යයන වර්ෂය අවසන් වන තෙක් සේවයේ රැඳී සිටිය හැකි ය. එහෙත් කුමන කරුණක් මත වුව ද, අදාල ආචාර්යවරයා සිය 66 වන උපන්දිනයට ප්‍රථමයෙන් සේවයෙන් විශ්‍රාම ගත යුතු වේ.

ආචාර්යවරුන් විශ්‍රාම ගැනීම

කරුණු එසේ වුවද, විෂමාචාරය, අකාර්යක්ෂමතාවය, සේවය පැහැර හැරීම පිළිබඳව, එම ආචාර්යවරයා පිළිබඳව ඔහු අනුයුක්තව සිටින, උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බල මණ්ඩලය විසින් පරීක්ෂණයක්

පවත්වා සේවය අත්හිටුවිය හැකි අතර, එබඳු පරීක්ෂණයක දී වැරදිකරු වුවහොත් අදාල පාලක බල මණ්ඩලය විසින් යෝජනා සම්මත කිරීමෙන් පසු ඔහු තනතුරෙන් අනිවාර්ය විශ්‍රාම ගැන්වීමකට හෝ පහ කිරීම ද අවකාශ තිබේ.

5.1.1 ආචාර්යවරයකු, තම විශ්‍රාම ගැනීමේ දිනයට යටත් පිරිසෙයින් මාස හයකට (06) ප්‍රථමයෙන්, තමන් විශ්‍රාම ගන්නා බව, අදාල අධ්‍යයනාංශ ප්‍රධාන හා පීඨයේ පීඨාධිපතිවරයා මඟින් ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා වෙත දැන්විය යුතු ය.

ආචාර්යවරයකු සේවයෙන් විශ්‍රාම ගන්නා බව දැන්වීම

5.1.2 මෙම ඡේදයෙහි "ආචාර්යවරයා" යන්නට පුස්තකාලයාධිපතිවරයකු, නියෝජ්‍ය පුස්තකාලයාධිපතිවරයකු, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරයකු සහ සහකාර පුස්තකාලයාධිපතිවරයකු ඇතුළත් වේ.

5.2 රජය විසින් වරින් වර තීරණය කරනු ලබන පරිදි රාජ්‍ය සේවයේ නිලධාරියකුගේ විශ්‍රාම ගැනීමේ වයස, කොමිෂන් සභාවේ / උසස් අධ්‍යපන ආයතනයක / විද්‍යායතනයක ආචාර්යවරයකු නොවන තනතුරක් දරන නිලධාරියකුගේ විශ්‍රාම ගැනීමේ වයස ලෙස, එසේ තිරණය කර ඇති දිනයට අනුව, බලපවත්වනු ඇත.

ආචාර්යවරයකු නොවන තනතුරක් දරන තැනැත්තන්ගේ විශ්‍රාම ගැනීම්

5.2.1 ඒ අනුව, වර්තමානයේදී ආචාර්යවරයකු නොවන තනතුරක් දරන තැනැතකුගේ ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමේ වයස අවුරුදු 55 සේ පිලිගැනේ. කෙසේ වුවද, යම් තැනැත්තකු එම ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ වයසින් ඔබ්බට සේවය කිරීමට අදහස් කරයි නම්, ඔහුට සේවා දීර්ඝ කිරීම සඳහා අයදුම් කිරිමකින් තොරව, අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස වන අවුරුදු 60 දක්වා සේවය කිරීමට අවකාශ ඇති අතර, එදිනෙන් පසු ඔහු ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගිය තැනැත්තාකු සේ සැලකේ.

ස්වේච්ඡාවෙන් හා අනිවාර්ය විශ්‍රාම යෑමේ වයස් සීමාව

5.3 ආචර්යවරයකු නොවන තනතුරක් දරන තැනැත්තෙකු, වයස අවුරුදු 55 සම්පූර්ණ වීම නිසා විශ්‍රාම යාමට අදහස් කරන විට, එසේ තමන් විශ්‍රාම යන බවට කරන දැන්වීම අවම වශයෙන් තමන් විශ්‍රාම යාමට නියමිත දිනට මාස තුනකට (03) කලින් අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාවේ නම් එහි සභාපතිවරයාට / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක නම් එහි ප්‍රධාන විධායක නිලධරයාට පිළිවෙලින් ලේකම්වරයා මඟින් / ලේඛාකාධිකාරීවරයා මඟින් දැන්විය යුතු ය.

ආචාර්යවරයකු නොවන තැනැත්කු සේ විශ්‍රාම යාමේ දැන්වීම

5.3.1 එසේ වුවද, වයස අවුරුදු 55 සහ 60 අතර කාලය තුල දී, එම තැනැත්තා හට තම අභිමාතයට අනුව අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාවට / පාලක බල මණ්ඩලයට මාස තුනක් (03) කල් දීමකින් පසු සේවයෙන් විශ්‍රාම ලැබිය හැකි ය.

5.3.2 එමෙන් ම, යම් තැනැත්තකු විෂමාචාරය, අකාර්යක්ෂමතාවය හෝ කාර්ය පැහැර හැරීම පිළිබඳව උචිත පරිදි කොමිෂන් සභාව විසින් හෝ ඔහු අනුයුක්තව සිටින උසස් අධ්‍යාපන ආයතනයේ/ විද්‍යාතනයේ පාලක බල මණ්ඩලය විසින් පරීක්ෂණයන් පවත්වන තුරු ඕනෑම වේලාවක ඔහුගේ සේවය අත්හිටුවීමට හැකි අතර, එම පරීක්ෂණයෙන් වරදකරු වුව හොත්, ඔහු කොමිෂන් සභාව විසින් හෝ පාලක බල මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවකට අනුව සේවයෙන් පහ කිරීමට හෝ අනිවාර්ය නිවාඩු යැවීමට ලක් කළ හැකි ය. (පනතෙහි 75 වන වගන්තියට අනුව)

5.3.3 අවුරුදු 55 න් ඔබ්බට සේවය කිරීමට අවසර දෙනු ලැබූ යම් තැනැත්තකු අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමට හෝ විශ්‍රාම පූර්ව නිවාඩු ගැනීමට අදහස් කරන අවස්ථාවකදී, ඔහු ඒ සම්බන්ධයෙන් මාස තුනක (03) පූර්ව දැනුම් දීමක් සිදුකළ යුතු ය.

විශ්‍රාම යාම සඳහා තුන් මාසක කල් දීම

5.4 ඉහත 5.2 උපඡේද හී දක්වා ඇති පරිදි රජය විසින් රාජ්‍ය සේවකයන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස තව දුරටත් දීර්ඝ කළ යුතු යැයි තීරණය කළ අවස්ථාවකදී හැර, ආචාර්යවරයකු නොවන කිසිඳු තැනැත්තකුගේ සේවය වයස අවුරුදු 60 න් ඔබ්බට දීර්ඝ නොකළ යුතුය.

## 6. සේවය අවසන් කිරීම

6.1 පත්වීම් බලධරයා හට පරිවාස කාලය තුල සිටින තැනැත්තකුගේ හෝ තවකාලික / අනියම් / දෛනික වැටුප් මත සේවයේ යොදවා ඇති තැනැත්තකුගේ සේවය කිසිඳු හේතු දැක්වීමකින් තොරව අවසන් කළ හැකි ය.

පරිවාස / තාවකාලික / අනියම් / දෛනික වැටුප් ලබන පත්වීම්

## 7. සේවය අතහැර ගියා සේ සැළකීම

7.1 කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු යම් තැනැත්තකු පූර්ව අනුමැතියකින් තොරව, සේවයට වාර්තා නොකරන අවස්ථාවක දී, ඔහු එසේ සේවයට නො පැමිණි දින සිට සේවය අතහැර ගියා සේ සැලකිය යුතු ය. එසේ සේවය අතහැර ගියා සේ සැලකීම වහාම ලියාපදිංචි තැපැලෙන් හෝ වෙනත් සුදුසු මාර්ගයකින් අදාල තැනැත්තා හට ලිඛිතව දැන්විය යුතු ය.

කඩිනමින් දැක්විය යුතුය

7.2 (අ) කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු මෙරට හෝ විදේශයක අධ්‍යයන නිවාඩු ලබා සිටින තැනැත්තෙකු, සිය අධ්‍යයන නිවාඩු කාලය අවසානයේ දී නැවත සේවයට වාර්තා නොකරන්නේ නම් හෝ ඔහුගේ ඉල්ලා අස්වීම කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය විසින්

අධ්‍යයන නිවාඩු පිට සිටින විටක දී

භාරගැනීමට නොහැකි තත්වයන් මත සේවයෙන් ඉවත්ව යන්නේ නම් ද, ඔහු සිය තනතුර අතහැර ගියා සේ සළකනු ලැබේ. එවැනි අවස්ථාවක දී එම තීරණය අදාල තැනැත්තා හට වහාම ලියාපදිංචි තැපැලෙන් හෝ වෙනත් සුදුසු මාර්ගයකින් ලිඛිතව දැන්විය යුතු ය.

(ආ)ඉහත සඳහන් නියමයන්, අවශ්‍ය ''වෙනස් කිරීමට යටත්ව'' මෙරට හෝ විදේශගත නිවාඩු මත සිට එකී නිවාඩු කාලය අවසන් වූ පසු කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයේ /විද්‍යායතනයේ සේවයට වාර්තා කිරීමට අපොහොසත් වන තැනැත්තාකු හට ද අදාල වනු ඇත.

වෙනත් ඕනෑම නිවාඩුවක් පිට සිටින විට

7.3 ඉහත 7.1 හෝ 7.2 උපඡේදයන්හි සඳහන් පරිදි සේවය අතහැර ගියාසේ සළකන ලද තැනැත්තකු හට, නැවත තම තනතුරේ සේවයට වාර්තා කිරීමට හෝ පැමිණීමේ ලේඛනයක් අත්සන් කිරීමට අවසර නො දිය යුතු ය.

නැවත සේවයට වාර්තා කිරීමට අවසර නොමැත

7.4 සේවය අතහැර ගියාසේ සළකන ලද අයෙකු විෂයයෙහි චෝදනා ගොනු කිරීමක් සිදු නොකළ යුතු අතර, ඔහු අනුමත නිවාඩු නොලබා සේවයට වාර්තා නොකිරීම හෝ විදේශයකින් නැවත දිවයිනට නොපැමිණීම සම්බන්ධයෙන් නිදහසට කරුණු විමසීමක් නොකළ යුතු ය.

චෝදනා ගොනු නොකිරීම

7.5 එම තැනැත්තා දිවයිනෙ හි සිටීනම් මාසයක් (01) ඇතුලත හෝ විදේශගතව සිටී නම් මාස තුනක් (03) ඇතුලත හෝ තම ස්වේච්ඡාවෙන් නිදහසට කරුනු ඉදිරිපත් කළ අවස්ථාවක දී, එකී කරුණු, III වන පරිච්ඡේදයේ 20.12 සහ 20.13 යන උපඡේදයන්හි දක්වා ඇති පරිදි සුදුසු තීරණයක් ගැනිම සඳහා අදාල විනය බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

ස්වේච්ඡාවෙන් නිදහසට කරුණු ඉදිරිපත් කළවිට

7.6 අදාල තැනැත්තා බැඳුම්කරයකට යටත් ව සිටීනම්, ඔහු විසින් කොමිෂන් සභාවට / උසස් අධ්‍යාපන ආයතනයට / විද්‍යායතනයට එකී ඇපබැඳුම්කරය යටතේ ගෙවීමට ඇති සියළු මුදල් තුන් මසක් (03) ඇතුලත සම්පූර්ණයෙන් ගෙවිය යුතු බවට, ඔහුගේ ඇපකරුවන් හට පිටපත් ද සහිතව දන්වා යැවිය යුතු ය. මෙම දැන්වීමට (මුදලට), ඔහුට ගෙවා ඇති සියළුම වැටුප්වල එකතුවක්, ගෙවන ලද වෙනත් දීමනා, , ගුවන් ගමන් ගාස්තු, ලියාපදිංචි ගාස්තු, විභාග ගාස්තු, අධ්‍යයන ගාස්තු, යැපීම් දීමනා, උණුසුම් ඇඳුම් දීමනා, ජීවන වියදම් දීමනා සහ වෙනත් දීමනා ද, කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනයක හෝ වෙනත් ආයතනයකින් ඔහුට පිරිනමන ලද ශිෂ්‍යත්වයන් / ප්‍රදානයන් / අරමුදලක වටිනාකම ද ඇතුලත් විය යුතු ය.

බැඳුම්කර මත සිටින තැනැත්තන්, එකී ඇපබැඳුම්කර සම්පූර්ණයෙන් පියවිය යුතු බව

7.6.1 ඉහත 7.6 උපඡේදයෙහි සඳහන් කර ඇති කාලය තුල ප්‍රධාන ණයගැතියාගෙන් පිළිතුරක් නොලැබුන විටක දී, ඇපබැඳුම්කරයේ සඳහන් මුදල් එක් මාසයක් තුල ගෙවා නිම කරන ලෙසට ඇපකරුවන් හට ලිඛිතව දැන්විය යුතු ය.

ඇපකරුවන් හට දැන්විය යුතු ය

7.6.2 ප්‍රධාන ණයගැතියා / ඇපකරුවන් විසින් නියම කර තිබූ කාලය තුල ඇපබැඳුම්කරයේ සඳහන් මුදල් ගෙවීමට අසමත් වූ විට, එකී මුදල් නැවත අයකර ගැනීම පිණිස හැකි ඉක්මනින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු ය. — නීතිමය ක්‍රියාමාර්ග

7.7 ඇපබැඳුම්කරයේ කොන්දේසි වලට අනුකූලව, එහි සඳහන් සියළුම මුදල් ගෙවා ඇති විට, කලින් ලැබී තිබූ ඉල්ලා අස්වීමේ ලිපිය, ඉල්ලා අස්වීම පිළිගැනීම සඳහා, අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාවට / පාලක බල මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු වේ. — බැඳුම්කරය සම්පූර්ණයෙන් ගෙවා ඇති විට

7.8 බැඳුම්කරයේ සඳහන් කිසිඳු මුදලක් පියවීමට කටයුතු කර නොමැති අවස්ථාවක දී, ශිෂ්‍යත්වය / ප්‍රදානය සිදුකල ආයතනය ද ඇතුලත් ව, එම තැනැත්තා සේවය අතහැර ගිය අයෙකු සේ සළකන ලද බව සහ ඔහු නැවත සේවයට වාර්තා කොට නැති බව අදාල බලධාරීන් හට වාර්තා කළ යුතු ය. ඒ සමගම, එම තැනැත්තා වාසය කරන බවට දැනගත් රටෙහි තානාපති කාර්යාලයට, ආගමන විගමන පාලක වෙත ද, ඔහුගේ ගමන් බලපත්‍රයෙහි හෝ වීසා බල පත්‍රයෙහි වලංගු කාලය දිර්ඝ කිරීමේ දී පැනවිය යුතු සීමා කිරීම් සිදු කිරීම සඳහා දැනුවත් කළ යුතු වේ. — කිසිඳු ගෙවීමක් සිදුකර නොමැති විට

7.9 කොමිෂන් සභාව විසින් / උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය විසින් අදාල තැනැත්තාගේ ඉල්ලා අස්වීමේ ලිපිය භාරගත් බවට හෝ භාර නොගත් බවට තීරණයන් ගන්නා තුරු, ඔහුගේ සේවය අවසන් වීම මත ලැබීමට නියමිත කිසිඳු ගෙවීමක් අනුමත නො කළ යුතු ය. — සේවය අවසන් වීම මත ගෙවීම් කිරීම සඳහා වූ පූර්ව කොන්දේසි

7.10 විශ්‍රාම යාම / ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් කළ යුතු දැන්වීම වෙනුවට සාමාන්‍යයෙන් අයවිය යුතු මාසයක වැටුප, එකී තැනැත්තාට කොමිෂන් සභාවෙන් / උසස් අධ්‍යාපන ආයතනයෙන් / විද්‍යාතනයෙන් ගෙවීමට ඇති මුදලින් අයකරගත යුතු මුදලක් ලෙස සැලකිය යුතු ය. — විශ්‍රාම යාමේ / ඉල්ලා අස්වීමේ දැන්වීම වෙනුවට වැටුප

## 8. සේවයෙන් පහකිරිම

යම් තැනැත්තෙකු සේවයෙන් පහ කිරීම ඔහුගේ හැසිරීමේ දෝෂ සහගත බව නිසා, එම තැනැත්තා කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවකයකු වීමට නුසුදුසු වේ යැයි යන පදනම මත වේ. — සේවයෙන් පහ කිරීමට හේතු

8.1 පනතෙහි විධිවිධානයන්ට අනුව මොනයම් හෝ සේවකයකු සේවයෙන් පහ කිරීමේ බලය කොමිෂන් සභාව වෙත [පනතෙහි 8 (3) (a) වගන්තිය අනුව], විශ්වවිද්‍යාලයක පාලක සභාව වෙත [පනතෙහි 45 (2) (xii) වගන්තිය අනුව], හෝ විශ්වවිද්‍යාල විද්‍යායතනයක කළමනාකරණ මණ්ඩලය වෙත [පනතෙහි 63 (3) වගන්තිය යටතේ] තිබිය යුතු ය. — සේවයෙන් පහ කිරීමේ බලය

8.1.1 යම් අධ්‍යයන ආයතනයක සේවයේ නියුතු අයෙකු සේවයෙන් පහ කිරීම පිණිස, එම ආයතනයේ කළමනාකාරණ මණ්ඩලය විසින් ආයතනය අනුබද්ධිතව පවතින විශ්වවිද්‍යාලය වෙත නිර්දේශ කළ යුතු වේ. — සේවයෙන් පහ කිරීමට නිර්දේශ කිරීම

8.2 උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක පාලක බල මණ්ඩලය විසින්, ආචාර්යවරුන් සහ නිලධාරීන් හැර, එම උසස් අධ්‍යාපන ආයතනයේ අනෙකුත් සේවකයින් පහ කිරීමේ බලය, එහි ප්‍රධාන විධායක නිලධරයා වෙත පවරනු ලැබිය හැකි ය. — සේවයෙන් පහ කිරීම උසස් අධ්‍යාපන ආයතන / විද්‍යායතන

8.2.1 යම් ආයතනයක [නිලධාරීන් හා ආචාර්යවරුන් හැර] සේවකයකු සේවයෙන් පහ කිරීමේ බලය, එම ආයතනය අනුබද්ධිතව පවතින විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් එහි උපකුලපතිවරයා හට පැවරිය හැකි ය.

8.2.2 පනතෙහි 7 (3) වගන්තියෙන් දක්වා ඇති ප්‍රකාර, කොමිෂන් සභාව විසින් යෝජනා සම්මත කර ගන්නා පරිදි, කොමිෂන් සභාවේ යම් තනතුරු වලට අයත් සේවකයින් තනතුරෙන් පහ කිරීමේ බලය එහි සභාපතිවරයාට පැවරිය හැකි ය. — කොමිෂන් සභාව

8.3 තනතුරෙන් පහකිරීමේ නියෝගයක් දීම සඳහා පාදක වූ චෝදනා ගොනු කිරීමේදී සහ පරික්ෂණ පැවැත්වීමේදී XIX පරිච්ඡේදයේ සඳහන් ක්‍රමවේදය අනුගමනය කළ යුතු ය. — තනතුරෙන් පහ කිරීමේ ක්‍රමවේදය

8.4 යම් සේවකයෙකු සේවයෙන් පහ කිරීම ක්‍රියාත්මක වන දිනය ලෙස සැලකිය යුතු වන්නේ කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනයක පාලක බල මණ්ඩලය එසේ යෝජනා සම්මත කරගත් දිනය හෝ කොමිෂන් සභාවේ සභාපතිවරයා / උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධරයා විසින් සේවයෙන් පහ කිරීමේ පරිපාලන නියෝගය දෙන ලද දිනයයි. — තනතුරෙන් පහ කිරීම ක්‍රියාත්මක වන දිනය

8.5 කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයෙන් පහ කරන ලද තැනැත්තකු විසින් පනතෙහි 86 (b) වගන්තිය ප්‍රකාර ව, විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. — අභියාචනා

## 9. මරණය නිසා සේවය අවසන් වීම

9.1 මරණය හේතුවෙන්, කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක යම් සේවකයකුගේ සේවය අවසන් වූ විට, එම තැනැත්තාගේ මරණය සිදු වූ මාසයට අදාල වැටුප ගෙවීම VI වන පරිච්ඡේදයේ 11 වන ඡේදයෙහි සඳහන් විධිවිධාන වලට අනුව සිදු කළ යුතු ය. — මරණයට පත් වූ සේවකයකුගේ වැටුප

## 10. සේවය අවසානයේ ලැබෙන ප්‍රතිලාභ

### 10.1 පාරිතෝෂික දීමනා ගෙවීම

10.1.1 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක පාරිතෝෂික දීමනාව ලැබීමට හිමිකම් ලැබූ සේවකයින් හට, එකී පාරිතෝෂික දීමනාව "1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීමේ පනතෙහි" සඳහන් විධිවිධාන වලට අනුව ගෙවිය යුතු ය. — පාරිතෝෂික දීමනාව ලබා ගැනීමට හිමිකම

10.1.2 තම සේවය අවසන් වන සෑම සේවකයකු ම (සේවකයා විසින් හෝ සේව්‍යයා විසින් සේවය අවසන් කළ විට හෝ විශ්‍රාම ගැනීම නිසා හෝ මරණය නිසා හෝ නීති පැනවීමක් නිසා හෝ වෙනයම් කරුණක් නිසා හෝ) කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක වසර පහක (05) සම්පූර්ණ සේවා කාලයක් සපුරා ඇති නම් පාරිතෝෂික දීමනාව ලැබීමට හිමිකම් ලබයි. — ගෙවිය යුතු විට

10.1.3 පාරිතෝෂික දීමනාව ලැබීම සඳහා හිමිකම් ඇති සේවකයෙකු හට අවස්ථාවෝචිත පරිදි ඔහු සේවය අවසන් කරන අවස්ථාවේ අනුයුක්තව සිට කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය විසින් පාරිතෝෂික දීමනාව ගෙවිය යුතු ය. — ගෙවිය යුත්තෝ කවුරුන් විසින් ද

10.1.4 පාරිතෝෂික දීමනාව ලැබීමට හිමිකම් ඇති සේවකයෙකු මිය ගියහොත්, එම පාරිතෝෂික දීමනාව ඔහුගේ උරුමක්කාරයන් වෙත ගෙවිය යුතු වේ. — මරණය නිසා සේවය අවසන් වීම

10.1.5 පාරිතෝෂික දීමනාව ලැබීමට හිමිකම් ඇති සේවකයකු හට හෝ ඔහු මරණයට පත් වී ඇත්නම්, ඔහුගේ උරුමක්කාරයන් හට හෝ එකී පාරිතෝෂික දීමනාව එම තැනැත්තාගේ සේවය අවසන් වූ දින සිට දින තිහක් (30) ඇතුලත දී ගෙවිය යුතු ය. — දින තිහක් (30) ඇතුලත ගෙවිය යුතුය

10.1.6 යම් සේවකයකු තම පාරිතෝෂික දීමනාව ලැබීමට පහත සඳහන් පරිදි ලැබීමට හිමිකම් ඇත. — ගෙවන ආකාරය

(අ) මාසික වැටුප් ලබන සේවකයකු නම්; ඔහු විසින් අවසානවරට ලබාගත් වේතනය හෝ වැටුප අනුව ඔහු සේවය කර ඇති සම්පූර්ණ අවුරුදු ගණනට, එක් අවුරුද්දකට ඔහුගේ මාසික වැටුපෙන් අඩක් බැගින් ගණන් බලා;

(ආ) වෙනත් සේවකයකු සම්බන්ධයෙන්, ඔහු සේවය කළ කාලය සඳහා ඔහු අවසන් වරට ලබාගත් වේතන හෝ වැටුප් අනුව

සම්පූර්ණ කරන ලද එක් අවුරුද්දක් වෙනුවෙන් දින දහහතරක (14) වේතන හෝ වැටුප් ගණන් බලා;

කරුණු එසේ වුව ද, කෑලි ගණනට (piece rate) සේවය කරන ලද සේවකයකු සම්බන්ධයෙන් නම්, ඔහුගේ දෛනික වේතනය හෝ වැටුප ගණන් ගත යුත්තේ, ඔහුගේ සේවය අවසන් කළ දිනෙන් අවසන් වන මාස තුනේදී (03) ඔහු ලබාගත් වේතන හා වැටුප් එම කාලය තුල දී ඔහු සේවය කළ දින ගණනින් බෙදීමෙනි.

10.1.7 පාරිතෝෂික දීමනාව ලැබීමට හිමිකම් ඇති යම් සේවකයකුගේ සේවය අවසන් කර ඇත්තේ සේව්‍යයාගේ මුදල්, වංචාවක්, මුදල් අයථා ලෙස පරිහරණය කිරීමක්, සේව්‍යයාගේ දේපල වලට හිතාමතා හානි සිදුකිරීමෙන් හෝ භාණ්ඩ, අයිතමයන්, දේපලවලට හානි සිදුකිරීමක් නිසා වෙන් නම්, එසේ ඔහු විසින් සිදුකළ හානියේ හෝ පාඩුවේ වටිනාකමට සරිලන මුදල් ප්‍රමාණයක් ඔහුගේ පාරිතෝෂික දීමනාවෙන් අහිමි කර ගනී. එසේ අහිමි කර ගන්නා මුදල තීරණය කළ යුත්තේ විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව ය. — වංචාවක්, අයථා පරිහරණය වෙනුවෙන් සේවය අවසන් කල තැනැත්තකු හට පාරිතෝෂික දීමනා ගෙවීම

10.1.8 යම් සේවකයෙකු හට මෙම ඡේදය යටතේ ගෙවීමට නියමිත පාරිතෝෂික දීමනාව හැර, සාමූහික ගිවිසුමක ප්‍රතිඵලයක් ලෙස හෝ කාර්මික අධිකරණයකින් හෝ බේරුම්කරුවකු මඟින් හෝ ප්‍රදානය කරන ලද පාරිතෝෂික දීමනාවකට හෝ සේවාන්ත ප්‍රතිලාභයක් ලැබීමට හිමිකම් නොලබයි. — පාරිතෝෂික දීමනා හෝ අනෙකුත් ප්‍රතිලාභ අහිමි වීම

10.1.9 දැනටමත් රාජ්‍ය සේවයේ හෝ වෙනත් ආයතනයක තමන් දායක මුදල් ගෙවනු නොලබන විශ්‍රාම වැටුප් ක්‍රමයකට හිමිකම් කියන්නා වූ තැනැත්තකු හට පාරිතෝෂික දීමනා නොගෙවිය යුතු ය. — විශ්‍රාම වැටුප් හිමි නිලධාරීන්

**සටහන** — Interpretation

මෙහි 10.1 උපඡේදයෙහි සඳහන් කරුණු නිශ්චය කිරීම සඳහා ;

(අ) “සම්පූර්ණ කරන ලද සේවය” යන්නෙන් අදහස් කරනුයේ, අඛණ්ඩ සේවා කාලයකි. මෙම අඛණ්ඩ සේවා කාලයට, කුමන කරුණක් නිසා හෝ ලබාගත් නිවාඩු, වැඩ වර්ජනයකින්, සේවයට වාර්තා කිරීම වළක්වාලීමකින් හෝ සේවකයාගේ වරදක් නොමැතිව ඔහුගේ සේවය නවත්වා තැබීමෙන් යන කරුණු ඇතුලත් වේ.

(ආ) ‘වේතන හෝ වැටුප්’ යන්නට;

(i) මූලික හෝ ඒකාබද්ධ වේතනය හෝ වැටුප ;

(ii) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ජීවන වියදම් දීමනාව සහ වෙනත් දීමනා;
(iii) නියම කරන ලද වැඩ ප්‍රමාණය ඉටු කිරීම මත කරන්නා වූ ගෙවීම් ඇතුලත් වේ ;

(ඇ) 'වර්ෂය' යන්නෙන්, සම්පූර්ණ කරන ලද මාස දොළහක (12) කාලයක් අදහස් වේ.

10.2 විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක වීම

10.2.1 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවය සඳහා පත්වීම් ලද සෑම තැනැත්තකුම, තමන් තනතුරේ රාජකාරි භාරගත් දිනයේ සිට, 'විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල' සඳහා තම මාසික ඉපයීම් වලින් 10% කට සමාන මුදලක් බැර කළ යුතු ය. එයට අමතරව එම අවස්ථාවේදී ම කොමිෂන් සභාව විසින් / උසස් අධ්‍යාපන ආයතනය විසින් / විද්‍යායතනය විසින්, එහි අරමුදල් වලින්, එක් එක් 'දායකයාගේ' මාසික ඉපයීම් වලින් 15% කට සමාන මුදලක් හෝ විශ්ව විද්‍යාල අධ්‍යාපනය භාර අමාත්‍යවරයා විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසීමෙන් අනතුරුව නියම කරනු ලබන මුදලක් එම 'අරමුදල' වෙත බැර කරනු ඇත. 1999 සැප්තම්බර් මස 01 වන දිනෙන් පසුව, විශ්වවිද්‍යාල පද්ධතියේ යම් තනතුරක් සඳහා පත්කළ තැනැත්තන් වෙනුවෙන්, මෙම පරිච්ඡේදයේ 10.3.1 උපඡේදයෙහි සඳහන් නියමයන්ට අනුව, ඉහත සඳහන් 15% ප්‍රමාණයෙන් 7%ක් ප්‍රමාණයන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සඳහා ද, අනෙක් 8% ප්‍රමාණය විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා ද බැර කෙරෙනු ඇත.

සටහන: (අ) 'අර්ථසාධක අරමුදල' යන්නෙන්, පනතෙහි 90 වන වගන්තිය සහ එම අරමුදල නියාමනය කිරීම,පරිපාලනය, සහ කළමනාකරණය සඳහා වූ කරුණු ඇතුලත් 2015 විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නියමාවලි අංක 01 ට අනුව කොමිෂන් සභාව විසින් ස්ථාපිත කරන ලද අර්ථසාධක අරමුදල හා එහි සංශෝධන ද අදහස් කෙරේ.

(ආ)කොමිෂන් සභාවේ 'අරමුදල' යන්නට පනතෙහි 10 වන වගන්තිය යටතේ ස්ථාපිත කරන ලද අරමුදල ද, උසස් අධ්‍යාපන ආයතනයන් / විද්‍යායතනයන් විෂයයෙහි 'අරමුදල' යන්නට,

පනතෙහි 99 වන වගන්තිය යටතේ ස්ථාපිත කරන ලද හෝ යම් ආයතනයක් විෂයයෙහි නම් එම ආයතනය පිහිටුවන ලද නියමාවලියෙහි සඳහන් නියමයන් අනුව ඇතිකල අරමුදලක් ද අදහස් කෙරේ.

(ඇ) 'දායකයා' යන්නෙන් අදහස් කරනුයේ අර්ථසාධක අරමුදලට දායක වූ කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක /විද්‍යායතනයක කාර්ය මණ්ඩල සාමාජිකයෙකි.

(ඇ) 'ඉපයීම්' යනුවෙන් අදහස් කරනුයේ, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතෙහි නිර්වචනය කර ඇති ඉපයීම් ය.

10.2.2 කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියකු විසින්, අර්ථසාධක අරමුදල සඳහා ප්‍රධාන ගිණුමක් ද, එක් එක් දායකයා සඳහා වෙන වෙනම ගිණුම් ද, විවෘත කොට පවත්වා ගෙන යා යුතු ය. අර්ථසාධක අරමුදලට දායක වූ සාමාජිකයකු විසින් සිදු කළ සියළුම බැර කිරීම් සහ කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනය විසින් එම දායකයා වෙනුවෙන් සිදු කරන ලද බැර කිරීම් ද, අර්ථසාධක අරමුදලේ එකී සාමාජිකයාගේ ගිණුමට බැර කල යුතු ය.

අර්ථසාධක අරමුදලේ ප්‍රධාන ගිණුම

10.2.3 සෑම උසස් අධ්‍යාපන ආයතනයක් ම / විද්‍යායතනයක් ම සහ කොමිෂන් සභාව ද අවස්ථාවෝචිත පරිදි, සෑම සේවකයෙකුගේම අර්ථසාධක අරමුදල් දායක මුදල නිසි පරිදි සෑම මසකට වරක් ඔහුගේ වැටුපෙන් අඩුකොට, එය සමඟ එකී සේවකයා වෙනුවෙන් ආයතනය විසින් දැරිය යුතු දායක මුදල ද, එක් එක් සේවකයා වෙනුවෙන් ප්‍රධාන අර්ථසාධක අරමුදල් ගිණුමට එවිය යුතු ය.

10.2.4 යම් සාමාජිකයකුගේ ගිණුමෙහි ඇති මුදල්, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන සංයුක්ත පොළියක් මත එම සාමාජිකයා සිය සේවය අවසන් කරන දිනය දක්වා රැස් කර තැබිය යුතු අතර, එසේ සේවය අවසන් වන දිනයේ දී එකී ගිණුම අවසන් කළ යුතු ය.

10.2.5 යම් සාමාජිකයකුගේ අර්ථසාධක අරමුදල් ගිණුම ඉහත සඳහන් පරිදි අවසන් කළ කල්හි, කොමිෂන් සභාවේ ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයෙකු විසින්, අදාල සාමාජිකයා සිය සේවය අවසන් කළ දිනය වන විට අර්ථසාධක අරමුදල් ගිණුමේ ඇති සම්පූර්ණ මුදල, එසේ එම ගිණුම වසා දමන ලද දිනයේ සිට මාස තුනක් (03) ඇතුලත දී ගෙවා නිමකල යුතු ය. — මාස තුනක කාලයක් ඇතුලත ගෙවිය යුතු ය

තව ද, එසේ ගිණුම වසා දමන ලද දිනය වන විට, අදාල සාමාජිකයාගෙන් ආයතනයට යම් අයවීමක් තිබේ නම්, එම අයවීම් අදාල ගිණුමෙන් ප්‍රථමයෙන් අයකර ගත යුතු මුදලක් සේ සැලකිය යුතු ය.

අඩු කිරීම්

(අ) සාමාජිකයාගේ සේවා කාලය තුල දී, කොමිෂන් සභාවට / උසස් අධ්‍යාපන ආයතනයට/ විද්‍යායතනයට, වංකභාවය නිසා හෝ නොසැලකිල්ල නිසා හෝ සිදු කරන ලද පාඩුවක් හෝ හානියකට සමාන වූ මුදලක්

(ආ) සාමාජිකයා විසින් රජයෙන්, කොමිෂන් සභාවෙන් / උසස් අධ්‍යාපන ආයතනයකින් / විද්‍යායතනයකින් ලබා ගත් ණය මුදලක් වෙනුවෙන් වූ ගෙවීමක්

(ඇ) තමන් විසින් ඉටු කිරීම පිණිස අත්සන් කරන ලද යම් ඇපබැඳුම්කරයක්, ගිවිසුමක් හෝ වෙනත් සාධන පත්‍රයක සඳහන් නියමයන්ට අදාලව සාමාජිකයා විසින්, තම අර්ථසාධක අරමුදලෙන් ගෙවීමට එකඟ වූ මුදල් ප්‍රමාණයක්

10.2.6 ඉහතින් නියමකොට ඇති තුන් මාසක (03) කාල සීමාවක් තුල අදාල සාමාජිකයාගේ වරදක් නොමැතිව ඔහුගේ අර්ථසාධක අරමුදල නොගෙවන අවස්ථාවක දී, එසේ අර්ථසාධක අරමුදල ගෙවන දිනයට කලින් එළඹෙන මාසයේ අවසන් දිනය දක්වා, එකී අර්ථසාධක අරමුදලේ ඇති ශේෂයෙහි, සංයුක්ත පොළියට (Compound Interest) සමාන ප්‍රමාණයකින් එකතු වූ පොළිය ද සමඟ ගෙවිය යුතු වේ.

10.2.7 තම මරණින් මතු, තමන් හට හිමි අර්ථසාධක අරමුදලේ ඇති මුදල් ප්‍රමාණය ගෙවිය යුතු තැනැත්තා / තැනැත්තන් පිළිබඳව අදාල සාමාජිකයා විසින් නම් කොට තිබිය යුතු ය. — නම් කිරීම සාමාජිකයා විසින්

(අ) අර්ථසාධක අරමුදලට දායක වූ තැනැත්තකු විසින්, සිදු කරන නම්

කිරීම, අර්ථසාධක අරමුදල් නියමාවලියේ 12 වන කොටසේ සඳහන් ආකෘති පත්‍රය පිරවීම මඟින් සිදු කළ යුතු ය.

(ආ) අර්ථසාධක අරමුදලට දායක වූ තැනැත්තකු විසින් නාම යෝජනා කරන අවස්ථාවක දී, එසේ නම් කරන තැනැත්තා වශයෙන් තම කලත්‍රයා සහ දරුවන් ද, විවාහ වී නැති අයෙකු නම් තමන් කැමති ඕනෑම අයෙකු තනිව හෝ සාමූහිකව සිටින පරිදි නම් කළ හැකි ය.

(ඇ) යම් සාමාජිකයකු විසින්, කිසිදු තැනැත්තකු නම් කිරීමට අකැමති වූ අවස්ථාවක දී, තමන් හට කිසිදු අයෙකු නම් කිරීමට නොමැති බව නියමිත අකෘති පත්‍රයේ නාම යෝජනා කිරීමට ඇති කොටසේ විස්තරාත්මකව සඳහන් කළ යුතු ය.

(ඈ) තම මරණයට පෙර, අදාල පරිදි සිදු කරන ලද නාම යෝජනාවන් අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාවේ ලේකම්වරයාට / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක ප්‍රධානියාට හෝ භාර දී නොමැති අවස්ථාවක දී, එකී නාම යෝජනාව නීතිය ඉදිරියේ වලංගුභාවයක් නොමැති සහ පිළිනොගැනෙන එකක් වනු ඇත.

(ඉ) එක් තැනැත්තකුට වඩා වැඩි දෙනෙකුගේ නම් යෝජනා කරන විට දී, ගෙවීමට නියමිත ප්‍රතිලාභ වලින් එක් එක් තැනැත්තාට ගෙවිය යුතු ප්‍රමාණයන් සාමාජිකයා විසින් අදාල අකෘති පත්‍රයේ පැහැදිලිව සඳහන් කළ යුතු වේ. එසේ ගෙවිය යුතු නිශ්චිත ප්‍රමාණයන් පිළිබඳව පැහැදිලි උපදෙස් ලැබී නොමැති අවස්ථාවක දී, ලැබිය යුතු ප්‍රතිලාභ සියළුම යෝජිතයන් අතරේ සමව බෙදා දෙනු ලැබේ.

(ඊ) යම් සමාජිකයකු විසින් ඉහත 10.2.7 උපඡේදයෙහි සඳහන් පරිදි තම අවසන් කැමති පත්‍රයේ සිදු කරන ලද නාම යෝජනාවක් බලාත්මක වනු ඇත. එයට වෙනස් අයුරකින් සඳහන් වී ඇති අවස්ථාවක දී වුව ද, ඉහත සිදුකරන ලද නාම යෝජනාවන් බලාත්මක වනු ඇත.

(ඌ) යම් නාම යෝජනාවන් අහෝසි වී ඇති බවට සැලකෙන්නේ; — නාම යෝජනා අහෝසි කිරීම

(i) සාමාජිකයා ජීවත්ව සිටිය දී, නම්කර ඇති තැනැත්තකු මරණයට පත් වූ විට, සහ එම තැනැත්තාට අමතරව වෙනත් නම් කිරීමක් නොමැති විට

(ii) සාමාජිකයා ජීවත්ව සිටිය දී, නම් කර ඇති තැනැත්තන් කිහිප දෙනෙක් අතුරින් එක් අයෙක් මරණයට පත් වූ විට

(iii) තම විවාහක/අවිවාහක බව, වෙනස් වූ අවස්ථාවක දී, එනම්; තම විවාහය හේතු කොට ගෙන, නාම යෝජනාවන් කර තිබූ විට

(iv) සාමාජිකයාගේ අත්සන සහතික කරන සාක්ෂිකරුවකු ඉදිරිපිට දී, සාමාජිකයා විසින් කරනු ලබන ලිඛිත දැනුම් දීමක් මඟින්, කලින් කර තිබූ නම් කිරීමෙන් හෝ පසුව කරන ලද නම් කිරීමක් අහෝසි කළ විට දී,

(ඌ) යම්, නම් කරන ලද තැනැත්තෙකු හට අර්ථසාධක අරමුදලෙන් ගෙවීම් කළ හැක්කේ, එම තැනැත්තා නියමිත පරිදි සාමාජිකයා විසින් නම් කර ඇති විටක දී සහ සාමාජිකයාගේ මරණින් පසුව ය.

(එ) සාමාජිකයා මරණයට පත්වන අවස්ථාවේ දී, වලංගු නම් කිරීමක් බල නො පවත්නා විටක දී හෝ එසේ නම් කොට සිටි තැනැත්තෙකු/ තැනැත්තන් මරණයට පත් වී තිබූ විට, මරණයට පත් වූ සාමාජිකයාගේ නිසි උරුමක්කාරයන් හට අර්ථසාධක අරමුදලේ ගෙවීම් කළ යුතු ය.

(ඒ) කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් නම් කොට ඇති තැනැත්තකුගේ අනන්‍යතාවය පිළිබඳව සෑහීමට පත්වන තුරු, එකී තැනැත්තාට සාමාජිකයාගේ ගිණුමට බැර කොට ඇති කිසිඳු මුදලක් ගෙවීම නොකළ යුතු ය.

10.2.8 යම් සාමාජිකයකුගේ ගිණුමට බැරකොට ඇති

මුදල්, එකී සාමාජිකයා විසින් නම් කොට ඇති තැනැත්තකු හට භාරදීම, සාමාජිකයා වෙනුවෙන් ඇති මුදල් සම්බන්ධයෙන් කොමිෂන් සභාවට ඇති සියළු බැඳීම් වලින් නිදහස් වීමක් වශයෙන් සැලකේ.

10.2.9 කොමිෂන් සභාවේ ලේකම්වරයා හෝ ඔහුගේ බලය පවරන ලද නිලධරයකු විසින් හෝ උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක ප්‍රධානියෙකු විසින් හෝ 2015 අංක 01 දරන විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නියමාවලියෙහි සහ එහි සංශෝධන්හි අඩංගු විධිවිධාන වලින් බැහැරවීමක් මත, තමන් අගතියට පත් වී ඇතැයි නිගමනය කළ ඕනෑම සාමාජිකයකු හට, එවැනි බැහැර වීමකට එරෙහිව කම්කරු කොමසාරිස්වරයා වෙත, අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. අගතියට පත් පාර්ශවයන්ගේ අභියාචනා

10.3 විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල

10.3.1 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක කාර්ය මණ්ඩලය සඳහා 1999 සැප්තැම්බර් 01 වැනිදායින් පසු ස්ථිර පත්කරන ලද සේවකයින්, විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ සාමාජිකයන් වන්නා හ. ( ඉහත 10.2.1 උපඡේදය බලන්න) 1999 සැප්තැම්බර් 01 වන දින වන විට දැනටමත් කාර්ය මණ්ඩල සාමාජිකයන් හට ද, එම විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වී සාමාජිකත්වය ලබා ගැනීම තෝරා ගැනීමට අවකාශය තිබේ. විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලේ සාමාජිකයන්

කරුණු එසේ වුවද, තමන් තනතුරට පත් වු දිනයේ සිට විශ්‍රාම ලබන දිනය තෙක් අවුරුදු 20ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමට නොහැකි වන ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයකු විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට දායක වීමට හිමිකම් නොලබයි.

සටහන : “විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල” යන්නට; පනතෙහි 97 වන වගන්තිය යටතේ, අදාල අරමුදල නියාමනය කිරීම, පාලනය කිරීම සහ කළමණාකරණය කිරීම පිණිස කොමිෂන් සභාව විසින් ස්ථාපිත කර ඇති 2020 අංක 04 දරණ විශ්වවිද්‍යාලයීය විශ්‍රාම වැටුප් නියමාවලිය අදහස් වේ.

10.3.2 විශ්‍රාම වැටුප් අරමුදල, නියාමනය කිරීම, පාලනය කිරීම සහ කළමනාකරණය කිරීම කොමිෂන් සභාවේ ලේකම්වරයා යටතේ පවතිනු ඇත.

10.3.3 කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින්, විශ්‍රාම වැටුප් අරමුදල සඳහා පොදු ගිණුමක් සහ එක් එක් සාමාජිකයා වෙනුවෙන්, වෙන වෙනම ගිණුම් ආරම්භ කොට පවත්වාගෙන යා යුතුය. යම් සාමාජිකයකු විෂයයෙහි කර ඇති සියළු දායකවීම්, විශ්‍රාම වැටුප් අරමුදලෙහි එම සාමාජිකයාගේ ගිණුමට බැර කළ යුතු ය. කොමිෂන් සභාවේ ලේකම්වරයා විශ්‍රාම වැටුප් අරමුදලෙහි ඇති මුදල්වල භාරකාරිත්වය දරනු ඇත.

10.3.4 කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන දායක මුදල, මාසයක් පාසා සෑම සේවකයකු වෙනුවෙන්ම අදාල සේව්‍යයා විසින් විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු වේ.

10.3.5 තම විශ්‍රාම ලබාගන්නා දිනය වන විට අවුරුදු 20 කට වැඩි සේවා කාලයක් සපුරා ඇති හෝ අවුරුදු 20 ක සේවා කාලයක් සපුරා, එහෙත් අයහපත් සෞඛ්‍ය තත්වය මත නියමිත විශ්‍රාම යාමේ දිනට පෙර සේවයෙන් විශ්‍රාම ලැබූ සාමාජිකයන් ද, පෙරකී 2020 දරණ අංක 04 දරන නියමාවලියේ සඳහන් ප්‍රතිශතයකින් මාසික විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ලබයි.

10.3.6 ආචාර්යවරයකු නොවන තනතුරක් දරන, තම ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමේ දිනයේ දී විශ්‍රාම ගත හැකි ව තිබුන ද අනිවාර්ය විශ්‍රාම ලැබීමේ දිනය දක්වා සේවය කළ හෝ එම දින දෙක අතරතුර දී සේවයෙන් විශ්‍රාම ලබාගත් අයෙකුට, කොමිෂන් සභාව විසින් නිගමනය කරන පරිදි සාමානුපාතිකව ගණනය කොට විශ්‍රාම වැටුප් ගෙවිය හැකි ය. ආචාර්යවරයෙකු, තම අනිවාර්ය විශ්‍රාම ගැනීමේ දිනයට ප්‍රථමයෙන් සේවය අවසන් කරන අවස්ථාවක දී, ඔහුට මාසික විශ්‍රාම වැටුපක් ලබා ගැනීමේ හිමිකමක් නොමැත.

10.3.7 වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම හෝ වෙනත් හේතුවක් නිසා විශ්‍රාම වැටුප් දායක මුදල් නොලැබෙන අවස්ථාවක දී, එසේ දායක මුදල් නොලැබෙන කාලයකට සමාන කාලයකින්, ගෙවීමට නියමිත විශ්‍රාම වැටුප් ගණනය කිරීමට අදාල සේවා කාලයෙන් අඩු කළ යුතු ය.

10.3.8 අවුරුදු 20 ක් හෝ වැඩි ප්‍රමාණයක් සේවා කාලයක් සපුරන ලද සාමාජිකයකුගේ මරණය සිදු වූ විට, ඔහුගේ යැපෙන්නන් සඳහා පහත සඳහන් පරිදි විශ්‍රාම වැටුප් ගෙවිය යුතුවේ;

(අ) විශ්‍රාම වැටුපෙන් 50% වැන්දඹුවට ගෙවිය යුතු ය.

(ආ) ඉතිරි 50% සාමාජිකයාගේ නිත්‍යානුකූල දරුවන් අතරේ සමානව බෙදීයන පරිදි ඔවුන් සිය 18 වන වියට එළඹෙන තෙක් ගෙවිය යුතු ය.

කරුණු එසේ වුවද, විශ්‍රාම වැටුපෙහි ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් යම් ආරාවුලක් ඇති වු කළ, අධිකරණයක් විසින් නියමිත පරිදි දෙන ලද තීන්දුවක් ප්‍රකාරව එම ප්‍රතිලාභ ගෙවිය යුතු ය.

10.3.9 සාමාජිකයකු හට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ඔහු සේවයෙන් විශ්‍රාම ගත් දිනයේ සිට හෝ මරණයට පත් වු දිනයේ සිට සාමාජිකයාට හෝ ඔහුගෙන් යැපෙන්නන් හට, දෛනිකව එකතුවීමට හැරීමෙන් පසු මාසිකව ගෙවිය යුතු ය.

10.3.10 විශ්‍රාම වැටුප් ලබන සාමාජිකයා හෝ ඔහුගේ යැපෙන්නන් විශ්‍රාම වැටුප් ලබන විට, අදාල පරිදි ඔවුන් ජිවත්ව සිටින බවට කොමිෂන් සභාවේ ලේකම්වරයා සෑහීමට පත්විය යුතු ය.

10.3.11 බාල වයස්කරුවකු හට විශ්‍රාම වැටුපක් හිමිවන අවස්ථාවක දී, එම විශ්‍රාම වැටුප එම ළමයා නමින් රජයේ අනුමත බැංකුවක ආරම්භ කරන ලද ගිණුමක තැන්පත් කළ යුතු වේ.

10.3.12 තමන් විශ්‍රාම යාමට, ඉල්ලා අස්වීමට හෝ සේවය නැවැත්වීමකට භාජනය වු එසේ විශ්‍රාම යන, ඉල්ලා අස්වන හෝ සේවය නැවැත් වු දින වන විට අවුරුදු 20 ක සේවා කාලයක් සපුරා නොමැති සේවකයකු හට, එතෙක් ඔහු වෙනුවෙන් පවත්නා ගිණුමෙහි ඇති මුදල් සහ එයට අදාල ගිණුමෙහි ඇති මුදල් සහ එයට අදාල පොළිය ද, එම සේවකයාගේ සේවය නැවැත් වු දිනයට ගණන් බලා ආපසු ගෙවිය යුතු ය.

10.3.13 අවුරුදු 20 ක සේවා කාලයක් සපුරා නොමැති සාමාජිකයකුගේ මරණය සිදු වු අවස්ථාවක දී, එම සාමාජිකයා නමින් ඇති ගිණුමේ මුදල් ප්‍රමාණය සහ එකතු වු පොළිය ද ඔහු විසින් නම් කරන ලද තැනැත්තකු / තැනැත්තන් සිටී නම්, ඔවුන්ට 2020 අංක 04 දරන විශ්‍රාම වැටුප් අරමුදල් නියමාවලියේ 7,8,9,10,11 සහ 12 යන වගන්ති වල අඩංගු කොන්දේසි ප්‍රකාරව ගෙවිය යුතු ය.

10.3.14 සෑම සාමාජිකයකු විසින් ම, ඉහත සඳහන් නියමාවලියේ 14,15,16 සහ 17 යන වගන්ති මඟින් නියමකොට ඇති පරිදි, තමන්ගේ පෞද්ගලික තොරතුරු, විවාහක / අවිවාහක භාවය හෝ එම වෙනස් වීම්, තමන්ගේ කලත්රයා සහ දරුවන් පිළිබඳ තොරතුරු ආදිය නියමිත කාල සීමාවන් තුළදී, ප්‍රමාණවත් සාක්ෂි ද සමඟ ප්‍රකාශ කොට ලබාදිය යුතු වේ.

10.3.15 සෑම සාමාජිකයෙක් විසින් ම, එක් එක් අවුරුද්දේ ජනවාරි මස 31 වෙනි දිනට ප්‍රථමයෙන් විශ්වවිද්‍යාලයීය විශ්‍රාම වැටුප් අරමුදල මඟින්, එම අරමුදලෙන් තමන් මාසික විශ්‍රාම වැටුප් ලබාගැනීමට හිමිකමක් ඇති බවට, කොමිෂන් සභාව මඟින් සකස් කරන ලද අකෘති පත්‍රය නිසි පරිදි පුරවා, කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

යම් සාමාජිකයකු නියමිත දිනට පෙර, පෙරකී ප්‍රකාශය ලබාදීමට අපොහොසත් වන්නේ නම්, ඔහු විසින් එකී ප්‍රකාශය ලබාදෙන තුරු ඔහුගේ මාසික විශ්‍රාම වැටුප අත්හිටුවීමට කටයුතු කරනු ඇත.

10.3.16 විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් නියමාවලියේ අඩංගු නියමයන්ට පරිබාහිර වූ කිසිදු නීතියකට අනුව, විශ්වවිද්‍යාලයීය විශ්‍රාම වැටුපට දායකවූ සාමාජිකයකු සතු එකී අරමුදලේ තැන්පත් කර ඇති මුදල්, කිසියම් ණය මුදලක්, බැඳුම්කරයන්, ගිවිසුමක් හෝ වෙනත් අය කර ගැනීමක් සඳහා ඇපයක් වශයෙන් අදාල කර ගැනීමට හෝ අත්පත් කර ගැනීමට පහත සඳහන් ආකාරයටම කිසිවිටකත් කටයුතු නො කළ යුතු ය.

කිසිදු ණය මුදලක්, බැඳුම්කරයන් ගිවිසුමක් වෙනුවෙන් ඇපයක් වශයෙන් අදාල කර ගැනීමට හෝ අත්පත් කර ගැනීමට නොහැකි බව

(අ) තම සේවා කාලය තුල දී, සාමාජිකයාගේ වංකභාවය, නොසැලකිල්ල හේතුවෙන් කොමිෂන් සභාවට / උසස් අධ්‍යයන ආයතනයට / විද්‍යායතනය විසින් දරන ලද යම් අලාභයක හෝ හානියක ප්‍රමාණය.

(ආ) කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක / වෙනත් ආයතනයක් හෝ පුද්ගලයෙකුගෙන් සාමාජිකයා විසින් ලබා ගත් ණය මුදලක ගෙවීම් සඳහා

(ඇ) සාමාජිකයා විසින් එළඹෙන ලද යම් ඇපබැඳුම්කරයක්, ගිවිසුමක් හෝ වෙනත් සාධන පත්‍රයකට අනුව ගෙවිය යුතු මුදලක්

(ඈ) කුමන හෝ අධිකරණයක් මගින් දෙන ලද ආඥාවක් හෝ ඇණවුම්කරයක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන්

එතෙකුදු වුවත්, ඉහත සඳහන් නියමයන්, විසි අවුරුදු (20) සේවා කාලයක් සපුරා නොමැති සහ එසේ විසි අවුරුදු සේවා කාලයක් සම්පූර්ණ කිරීමට පෙර සේවයෙන් විශ්‍රාම ලැබීම , සේවය අතහැර ගියා සේ සැලකීම හෝ සේවය නතර කරනු ලැබීම යන කරුණු මත සේවය අවසන් වූ සාමාජිකයින් විෂයයෙහි බල පැවැත්වෙන්නේ නැත.

එවැනි අවස්ථාවක දී, එම සාමාජිකයාගෙන් යම් අයවීමක් තිබේ නම්, එසේ අය කිරීමට පෙර, කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන උපදෙස් ප්‍රකාරව, අදාල සාමාජිකයාගේ ලිඛිත කැමැත්ත ලබා ගත යුතු වේ.

10.4 සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (ETF)

10.4.1 කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සෑම සේවකයකු ම (1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සහ එහි සංශෝධනයන්වල 44 වන කොටසට අනුව ) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ සාමජිකයින් වන්නාහු ය. [1993 අංක 19 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ (විශේෂ විධිවිධාන ) පනතට අනුව]

10.4.2 කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක අදාල පරිදි සේවයේ නියුතු සෑම සේවකයකු වෙනුවෙන් ම, එකී සාමාජිකයාගේ සම්පූර්ණ මාසික ඉපයීම් වලින් 3% කට සමාන මුදලක් එම කොමිෂන් සභාව/ උසස් අධ්‍යාපන ආයතනය විසින් සෑම මාසයක් සඳහා ම, එළඹෙන මාසයේ අවසන් දිනට පෙර ගෙවීමට බැඳී සිටියි (අදාල පනතෙහි සහ එහි සංශෝධන වල 44 වන වගන්තිය මඟින් දක්වා ඇති පරිදි)

10.4.3 සේව්‍යයා විසින් යම් සේවකයකු වෙනුවෙන් ගෙවන ලද දායක මුදල්, අරමුදලේ එම සේවකයාගේ පුද්ගලික ගිණුමට බැර කළ යුතු ය.

10.4.4 තම සේවය අවසන්වීමේ දී, අදාල පනතෙහි පනවා ඇති කොන්දේසිවලට යටත් ව, තමන් වෙනුවෙන් බැරකරන ලද මුදල් සහ එහි එකතු වූ පොළිය ද නැවත ලබා ගැනීමට එකී සේවකයින් හට හිමිකම ලැබේ.